# රිටිගල ශිලාලේඛනයන්හි නිරූපිත සිංහල අක්ෂර මාලාවේ විකාසනය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

තේජා නානායක්කාර[1]

සිංහල අක්ෂර මාලාවේ ආරම්භය පිළිබඳ විවිධ මතවාද පවතින අතර ක්‍රි.පූ. 3 වැනි සියවසේ දී සිදු වූ මහින්දාගමනයෙන් අනතුරුව එහි ආරම්භය සිදු වූ බව පිළිගත් මතය යි. රිටිගල ශිලාලේඛන මඟින් නියෝජනය වන්නේ පූර්ව බ්‍රාහ්මී යුගයයි. රිටිගල ශිලාලේඛන මඟින් සිංහල අක්ෂර මාලාවේ විකාසනය නිරූපණය වන ආකාරය කෙබඳු ද? යන පර්යේෂණ ගැටලුව කේන්ද්‍ර කරගෙන මෙම අධ්‍යයනය සිදු කෙරේ. සිංහල අක්ෂර මාලාවේ විකාසනය උදෙසා රිටිගල සෙල්ලිපි දායක වී ඇත යන උපන්‍යාසය මත පිහිටා මෙම පර්යේෂණය සිදු කෙරේ. ප්‍රස්තුත අරමුණ සාධනය කරගැනීම සඳහා ප්‍රාථමික මූලාශ්‍රය ලෙස රිටිගල ශිලාලේඛන ද ද්විතීයික මූලාශ්‍රය ලෙස ග්‍රන්ථ, ලිපි ලේඛන හා අන්තර්ජාල ලිපි ලේඛන යොදා ගැනුණි. රිටිගල ශිලාලේඛන මඟින් විද්‍යමාන වන අක්ෂර බොහොමයක් අශෝක බ්‍රාහ්මී අක්ෂරයන්ට සමාන වන අතර ඇතැම් අවස්ථාවන්වල දී යම්බඳු වෙනස්වීම්වලට බඳුන් වී ඇත. ව්‍යඤ්ජනාරූඪ ස්වර සඳහා අශෝක බ්‍රාහ්මී අක්ෂර මාලාවේ භාවිත වූ සංකේත එලෙසම සිංහල ප්‍රාකෘතයේ ද භාවිත වූ බව පෙනී යන අතර සෙල්ලිපි අක්ෂරවලට අමතරව සංකේත යොදාගත් අවස්ථා ද හඳුනාගත හැකිය. වර්තමාන සිංහල අක්ෂර මාලාවේ සඳහන් වී ඇති සිංහල අක්ෂර සියල්ලම රිටිගල සෙල්ලිපි අක්ෂර අතුරින් හඳුනාගත නොහැකි වුව ද බොහොමයක් අක්ෂර ඒවායේ අන්තර්ගත වී ඇති බව එම සෙල්ලිපි අධ්‍යයනය කිරීමේ දී පැහැදිලි වේ. බ්‍රාහ්මී අක්ෂර මාලාවේ 'අ' ස්වරය දෙපසින් විහිදෙන රේඛාවේ හරි මැදින් සම්බන්ධ වී ලතාකාර ව ඉහළට විහිදේ. එහෙත් රිටිගල 'අ' ස්වරය දෙපසින් විහිදෙන රේඛා අතර යම් පරතරයක් විශද වේ. 'ක' අක්ෂර රූපය ද අශෝක අක්ෂර රූපයට සමාන වුව ද රිටිගල 'ක' අක්ෂරයේ රේඛා අශෝක අක්ෂරයන්ට සාපේක්ෂව තරමක් දීර්ඝ වී ඇත. රිටිගල සෙල්ලිපි පරීක්ෂා කිරීමේ දී එම සෙල්ලිපිවලටම ආවේණික වූ අක්ෂර රටා බොහොමයක් ද හඳුනාගත හැකි විය. ම, ශ, ෂ ආදී අක්ෂරයන්හි විකාසනය ද, අක්ෂර රේඛා දීර්ඝ වූ අවස්ථා ද, අක්ෂර හා බැඳි පිල්ලම් ලතාකාර වූ අවස්ථා ද හඳුනාගත හැකි විය. අක්ෂර වර්ගීකරණය පිළිබඳව සැලකීමේ දී මූර්ධජ 'ණ' සහ 'ෂ' අක්ෂර මෙන් ම ඕෂ්ඨජ 'හ' අක්ෂරය රිටිගල සෙල්ලිපි ඔස්සේ පැහැදිලිව විශද වේ. ඒ අනුව රිටිගල ශිලාලේඛන මඟින් සිංහල අක්ෂර මාලාවේ විකාසනය හා සම්බන්ධ සාධක විද්‍යමාන වන බව නිගමනය කළ හැකි ය.

ප්‍රමුඛ පද : අශෝක බ්‍රාහ්මී අක්ෂර, රිටිගල ශිලාලේඛන, පූර්ව බ්‍රාහ්මී යුගය, සිංහල අක්ෂර මාලාව

[1] භාෂා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය.thejananayakkara93@gmail.com